# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2151/4 - 2019 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2019.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ

16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන

**දැන්වීම**

යෝජිත ද්‍රවීකෘත ස්වාභාවික වායු ව්‍යාපෘතිය, කොළඹ වරාය, කැළණිතිස්ස, කෙරවලපිටිය

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 දරන ලිපිනයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් සමාගම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද කොළඹ වරාය, කැළණිතිස්ස හා කෙරවලපිටිය ආශ්‍රිතව ක්‍රියාත්මක කරන යෝජිත ද්‍රවීකෘත ස්වාභාවික වායු ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2019.11.25 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 2. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - | 3 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 |
| 3. | මධ්‍යම පරිසර අධිකාරිය | - | නො. 104, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 4. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | - | අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 |

5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොළඹ
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වත්තල
7. මහ නගර සභාව - කොළඹ
8. ප්‍රාදේශීය සභාව - වත්තල

මෙම යෝජිත ද්‍රවීකෘත ස්වාභාවික වායු ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2019.11.25 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197,
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.

12 - 61

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.